# 20 අසරණ සරණ



සිරි සුනන්ද විදුහලේ පැවැත්වෙන රැස්වීමට හවස තුන වන විට ගමේ තරුණ හා වැඩිහිටි බොහෝ දෙනෙක් පැමිණියා. **සංහිඳපුර** ග්‍රාම සංවර්ධන සමිතියේ තරුණ පිරිස තමයි මේ රැස්වීම කැඳවලා තිබුණේ. ගංවතුරෙන් විපතට පත් ව සිටින ප්‍රදේශවාසීන්ගේ සුබ සාධනය සඳහා ඉක්මනින් පියවරක් ගැනීමටයි කාටත් වුවමනා වුණේ. විදුහල්පතිතුමාට රැස්වීමේ මුලසුන පිරිනැමුණා.

පහත දැක්වෙන්නේ එද ඇති වූ සාකච්ඡාවෙන් කොටසකි.

**විදුහල්පති** : අද මේ රැස්වීමට ගමේ විශාල පිරිසක් පැමිණීම ගැන හරි ම සතුටු යි. මේ රැස්වීමේ අරමුණ ගැන පැහැදිලි කරන්නට කවුද ඉදිරිපත් වෙන්නෙ?

**සම්පත්** : විදුහල්පතිතුමනි, ඔබතුමා ම පැහැදිලි කරන්න.

**විදුහල්පති** : පසුගිය සතියේ ඇතිවුණු ගංවතුරින් ගෙවල්දෙරවල් යටවෙලා බොහෝ දෙනෙක් අනාථ වුණු බව කවුරුත් දන්නවානෙ. ඒ අයට පුළුවන් තරම් ඉක්මනින් ආධාර උපකාර ලබා දීම අවශ්‍යයි. දැනටමත් අපේ පාසලේ ආදි ශිෂ්‍ය තරුණ ළමයි කණ්ඩායමක් එකතුවෙලා ආධාර ටිකක් එකතු කරගෙන තියෙනවා. හාල්, සීනි, පිටි, පරිප්පු, ඇඳුම්

වගේ දේවල්. ඒවා බෙදා දෙන්නත් ඕන. සමහර ළමයින්ගෙ පාසල් පොත් පවා විනාශ වෙලා. ඒ නිසා පොත්, පෑන්, පැන්සල් එහෙමත් අවශ්‍ය වෙනවා. මේ දේවල් ඉක්මනට ලබාගත හැකි ආකාරයක් අපි මේ වෙලාවෙදි කතා කරගන්න ඕන. හොඳයි, දැන් ඔබ හැමගේ අදහස් ඉදිරිපත් කරන්න.

**නිශාන්ත** : මුලින් අපි අරමුදලක් පිහිටුවා ගන්න ඕන.

**සමන්** : අපි කොටු කපන කාඩ් එකක් හදල ඉස්කෝලෙ ළමයින් අතේ ඇරලා ආධාර ලබා ගනිමු.

**සම්පත්** : ඒක හොඳ අදහසක්.

**විදුහල්පති** : ශ්‍රමදානයකින් ගංවතුරෙන් කැඩුණු ගෙවල් ටික අලුත්වැඩියා කරලා දෙමු ද?

**බොහෝ දෙනෙක්** : විදුහල්පතිතුමාගෙ අදහසට අපි කැමතියි.

**විදුහල්පති** : සඳුදා උදේ රැස්වීමේ දි මේ කරුණු පැහැදිලි කළොත් හොඳයි. ඒකට ආදි ශිෂ්‍යයකු ඉදිරිපත් වෙන්න.

**අසේල** : මම ඒක භාර ගන්නම්.

## ක්‍රියාකාරකම : 1

සිසුන් කණ්ඩායම් වශයෙන් එක් ව අවස්ථා නිරූපණයක් වන සේ මේ සාකච්ඡාව ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 2

සෑම ශිෂ්‍යයකු ම තමන් අසේල යැයි සිතා සඳුදා උදේ රැස්වීමේ දී ඉදිරිපත් කරන කතාව පන්තිය ඉදිරියේ පවත්වන්න.

## ක්‍රියාකාරකම : 3

කළු කර ඇති පද නිවැරදි ව උච්චාරණය වන සේ පහත දැක්වෙන වාක්‍යාංශ ශබ්ද නගා කියවන්න.

- **සිරි සුනන්ද** විදුහලේ පැවැත්වෙන.
- **සංහිඳපුර ග්‍රාම සංවර්ධන** සමිතියේ.
- තරුණ **පිරිස** තමයි මේ **රැස්වීම** කැඳවලා තිබුණේ.
- **ප්‍රදේශ වාසීන්ගේ සුබ** සාධනය සඳහා.
- මේ රැස්වීමට ගමේ **විශාල පිරිසක්**
- ආධාර උපකාර ලබා දීම **අවශ්‍යයි.**
- අපේ පාසලේ **ආදි ශිෂ්‍ය** තරුණ ළමයි.
- සමහර ළමයින්ගෙ පොත් පවා **විනාශ වෙලා.**
- **මුලින්** අපි අරමුදලක් පිහිටුවා ගන්න ඕන.
- අපි **ශ්‍රමදානයකින්** ගංවතුරින් කැඩුණු ගෙවල් ටික අලුත්වැඩියා කරල දෙමු ද?
- ඒකට ආදි **ශිෂ්‍යයකු** ඉදිරිපත් වෙන්න.

## ක්‍රියාකාරකම : 4

ස්වාභාවික ආපදවක් පිළිබඳ ව ඔබ දන්නා අත්දැකීමක් පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 5

පහත දැක්වෙන වාක්‍ය නිවැරදි උච්චාරණයෙන් යුතු ව තනි තනි ව ශබ්ද නගා කියවන්න.

- මට සහෝදර සහෝදරියන් තුන්දෙනෙක් ඉන්නවා.
- කසළ ඉවත් කිරීම සඳහා නගර සභාව අවශ්‍ය පියවර ගන්නවා.
- ගංවතුරින් විපතට පත්වූවන් ගැන අප සිත් තුළ මහත් ශෝකයක් තිබෙනවා.
- ප්‍රදේශයේ ගංවතුර ගැලීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට එක් වන්න.

* පාසල් බසය නොකඩවා ධාවනය කරන ලෙස ඉල්ලා අදාළ අංශය වෙත ලියුමක් යවන්න.
* සියලුදෙනාට ම ආදර්ශයක් වන ලෙස කටයුතු කිරීම වැඩිමහල් අයගේ යුතුකමකි.
* රසවත් ආහාර ගැනීමට කවුරුත් කැමති ය.
* ඊළඟ ශනිදා සවස තුනට පාසලට පැමිණෙන්න.
* ශබ්දවිකාශන යන්ත්‍රය සන්නිවේදන මාධ්‍යයකි.
* මම ලබන වසරේ දී නව වන ශ්‍රේණියේ ඉගෙනුම ලබමි.
* අපේ රටේ ස්වාභාවික සම්පත් බහුල ය.
* පෞද්ගලික බසයක ගමන් කරන මගීන්ට ප්‍රවේශ පත්‍ර ලබා දීම බස්හිමියන්ගේ වගකීමකි.
* තමන්ගේ සතුට සඳහා අනුන්ට හිරිහැර නො කරන්න.
* මල්ලී සරම අල්ලාගෙන උඩ පනියි.
* විදුහලේ දියුණුවට සහාය දීම ආදි ශිෂ්‍යයන්ගේ යුතුකමකි.

## ක්‍රියාකාරකම : 6

තද කළු අකුරින් දක්වා ඇති පද ගැන සැලකිලිමත් වෙමින් 'අ' සහ 'ආ' කොටුවල ඇති වාක්‍ය කියවන්න.

| අ | ආ |
|---|---|
| i. හවස තුන වන විට ගමේ තරුණ හා වැඩිහිටි **බොහෝ දෙනෙක්** පැමිණියා. | i. ගමේ **විශාල පිරිසක්** පැමිණීම ගැන හරි ම සතුටුයි. |
| ii. ගංවතුරින් **විපතට පත් ව සිටින** ප්‍රදේශවාසීන්ගේ සුබ සාධනය සඳහා ඉක්මනින් පියවරක් ගැනීමටයි කාටත් වුවමනා වුණේ. | ii. ගෙවල් දොරවල් යටවෙලා බොහෝ දෙනෙකු **අනාථ වුණු** බව කවුරුත් දන්නවනෙ. |

පහත දැක්වෙන වගුවේ 'අ' කොටසේ කළු කර ඇති පදවලට සමාන පද 'ආ' කොටසෙන් තෝරා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

| අ | ආ |
|---|---|
| i. අම්මා එන බව දැක දරුවෝ ඉදිරියට පැමිණියහ. | i. අලියාගේ හස්තය හොඬවැලයි. |
| ii. ගස් වැල් මල්වලින් අලංකාර වී ඇත. | ii. මහල් නිවාසවල බොහෝ දෙනෙක් පදිංචි ව සිටිති. |
| iii. ගංවතුරෙන් බොහෝ ගෙවල්වලට හානි සිදු විය. | iii. මැණියෝ දහවල් ආහාරය පිළියෙල කළහ. |
| iv. ළමයිනි, දකුණු අත ඔසවන්න. | iv. විදුහලට දෙමාපියන්ගේ සහයෝගය අවශ්‍යයි. |
| v. මා පාසලට යන්නේ බසයෙනි. | v. කුසුම් පිපී සුවඳ හමයි. |
| vi. දෙනෙත් හැර පරිසරය නරඹන්න. | vi. සඳ අහසේ බබළයි. |
| vii. චන්ද්‍රයා තරු පිරිවරා සිටී. | vii. තාත්තා අපට තෑගි ගෙනෙයි. |
| viii. මගේ පියා ගුරුවරයෙකි. | viii. ඇයගේ ඇස් දෙක ම අන්ධ ය. |